# මගේ බෝනික්කා



ඩබ්.ඩබ්.ඩී. දෙවන්ෂා

# මගේ බෝනික්කා

ඩබ්.ඩබ්.ඩී. දෙවන්ෂා

ප්‍රථම මුද්‍රණය : 2025/02/08

කර්තෘ : ඩබ්.ඩබ්.ඩී. දෙවන්ෂා

ලිපිනය : නො.205/5, තල්වත්ත
මහනුවර

කර්තෘගේ වෙනත් කෘති : සුදුවා සහ කළුවා
නපුරු නංගි
රතු පැංචා

**ISBN** අංකය : **IS37808**

මුද්‍රණය

**"UNIQUE CREATIONS"**

නො: 43 බී, තැන්නෙකුඹුර,

මහනුවර.

# පිදුම

ජීවිතයට අවබෝධයෙක් ලබා දෙමින්
දැනුමෙන් මා පෝෂණය කරන්නා වූ
මාගේ ආදරණීය ගුරු මෑණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්

සෙවනැල්ලක් සේ මා පසුපස සිට
මා පෝෂණය කර ඇති දැඩි කරන
මාගේ ආදරණීය දෙමව්පියන්ටත්

මා මෙන්ම දැනුම සොයා යන
මාගේ යෙහෙලියන්ටත්
මේ පොත ආදරයෙන් මා පුද කරමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක
පුංචි ගෙදරක් තිබුණා.
එහි ජීවත් වුනේ අම්මා තාත්තා
දුව සහ පූසෙකුයි.
දුවගේ නම චූටී



එයා හැමදාම අහල පහල ගෙවල්වල ළමයින් සමඟ සෙල්ලම් කරනවා. ඒ යනකොට පූසත් යනවා. චූටිට බෝනික්කෙක් හිටියේ නෑ. එයා හැමදාම සෙල්ලම් කළේ යාළුවන්ගේ බෝනික්කෝ සමඟයි.



චූටි දවසක් අම්මට කිව්වා
"අම්මේ මටත් ලස්සන බෝනික්කෙක්
ඕනේ" කියලා අම්මට දුක හිතුණා.
එයාලට හුඟක් මුදල් තිබුණේ නැති නිසා.



අම්මා තාත්තට මේ බව කිව්වා.
"දුවගේ උපන් දිනය දවසට මම කොහොම
හරි බෝනික්කෙක් ගෙනත්
දෙන්නම්" තාත්තා කිව්වා



චූටිගේ උපන් දිනයත් ආවා.අහල පහල යහළුවන් හැමෝමත් ආවා. චූටි කේක් ගෙඩිය කැපුවා හැමෝටම කැවුවා. අම්මා ලස්සන බෝනික්කෙක් චූටිට තෑගි දුන්නා.



බෝනික්කාව දැකපු චූටි සතුටින් උඩ පැන්නා. අම්මාව බදා ගත්තා. පහුවෙනිදා චූටි බෝනික්කාවත් අරගෙන සෙල්ලම් කරන්න ගියා. පූසත් වෙනදා වගේම චූටි පස්සෙම ගියා.



චූටි බෝනික්කා සමඟ සෙල්ලම්
කරමින් ඉඳලා ටික වෙලාවකට
බෝනික්කා බිමින් තිබ්බා.
චූටිගේ යාළුවා සමඟ ටික වේලාවක්
කතාවට වැටුණා.
එයාට බෝනික්කාව අමතක වුණා.



පූසා බෝනික්කා ළඟට ගියා.
බෝනික්කාගේ කොණ්ඩය සමඟ සෙල්ලම්
කරන්න පටන් ගත්තා. බෝනික්කාගේ
ලස්සන කොණ්ඩය ටිකෙන් ටික
කැඩෙන්න පටන් ගත්තා. ලස්සන
බෝනික්කා කැත වුණා.



චූටි බෝනික්කා ළඟට එනකොට ලස්සන බෝනික්කාගේ කොණ්ඩය හැමතැනම විසිරිලා තිබුණා. චූටිට හොඳටම කේන්ති ගියා. හයියෙන් කෑ ගැහුවා.
ළඟ තිබුණ කෝටුවක් අරගෙන පූසාට හොඳටම ගැහුවා.



වේදනාව දරාගන්න බැරිවුණ පූසා
මහ හයියෙන් කෑ ගැහුවා.
අම්මා දුවගෙන එතනට ආවා.
සිදු වී ඇති දෙය වටහා ගත්තා. අඬමින්
සිටි චූටිව සනසා පූසා දිහා බැලුවා.



පූසාට නැගිට ගැනීමට නොහැකිව වේදනාවෙන් කෑ ගැසුවා. අම්මා චූටිට ලස්සන ඔවදනක් දුන්නා. "මගේ චූටි දුවේ සතුන්ට අපිට වගේ හොඳ නරක තේරෙන්නේ නෑ. අපිට වගේ හිතලා කටයුතු කරන්නත් එයාලට බෑ. එයාලා හරිම අහිංසකයි."



"අපිට වගේම එයාලටත් වේදනාව
දැනෙනවා.ඒත් පුතේ අපිට රිදෙනවා
කියලා කටින් කියන්න පුළුවන් වුණාට
පූසාට කතා කරලා මට රිදෙනවා කියන්න
බෑ.ඒ නිසා සතුන්ට කවදාවත්ම හිංසා
කරන්න එපා. එයාලා පවු නේද පුතේ"
කියලා චූටිගේ හිස අතගෑවා.



චූටිට අම්මා කියලා දුන්නු ඔවදන හොඳින් වැටහුණා. තමන් කළ වරද තේරුම් ගත් චූටි පූසාට "සමාවෙන්න පැටියෝ" කියලා උගේ හිස අතගෑවා. අම්මාට පොරොන්දු වුණා එයා ආයේ කවදාවත්ම සතුන්ට හිංසා කරන්නේ නෑ කියලා.



මගේ පුංචි යාළුවනේ,
නැන්දේ, මාමේ
අපි සතුන්ට ආදරය කරමු.
එයාලව රැකබලා ගනිමු.

නිමි.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්